**ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,630.11 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,273.12 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,357 ක් හෙවත් සියයට 65 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 573.13 | 571.16 | 1.97 | 0.34 |
| මූලධන | 3,056.99 | 701.96 | 2,355.03 | 77.04 |
| **එකතුව** | **3,630.12** | **1,273.12** | **2,356.99** | **64.93** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 15.39 | 10.07 | 9.50 | 11.87 | 70.00 | 44.18 |

**2.3 විගණන නිරීක්ෂණය**

මුදල් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ශේෂවල එකතුව රු. 920,947 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.2 පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මුදල් අමාත්‍යාංශයට නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණු ටයිම්ස් ගොඩනැගිල්ලෙහි පුද්ගලික සමාගමක් ස්ථාපිත කර තිබූ අතර, එම සමාගම විසින් ගොඩනැගිල්ලේ කොටසක් වෙනත් පෞද්ගලික සමාගමක් වෙත කුලියට දීමෙන් 2013 ඔක්තෝබර් මාසයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව රු. 9,450,000 ක ආදායමක් උපයාගෙන තිබුණි. ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු එම ආදායම බාහිර පාර්ශවයක පරිහරණයට ඉඩ දී තිබුණි.

**3.3 බේරුම් නොකළ බැරකම්**

ටයිම්ස් ගොඩනැගිල්ල වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු වරිපනම් රු.5,061,052 ක් 2016 ජූලි 31 දින වන විටත් ගෙවා නොතිබුණි.

**3.4 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIX පරිච්ඡේදයේ 5.2.1. වගන්තිය | උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් නැති නිලධාරියෙකු රජයේ නිවාසයක පදිංචිවීම හේතුවෙන් විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 12 1/2 ක් අයකර ගතයුතු වුවත් නිවාසලාභී නිලධාරීන් 02 ගේ වැටුපෙන් සියයට 10 ක් පමණක් අයකර තිබීම නිසා මාසිකව රු. 1,679 ක් රජයට අහිමි වී තිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | රාජ්‍ය සේවයේ නියුතු වූ අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචි වී සිටින විට උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් නොමැති නම් ඒ දෙදෙනාගෙන් වැඩි වැටුප් ලබන නිලධාරියාගේ වැටුපෙන් සියයට 12 1/2 ක් සහ අඩු වැටුප් ලබන නිලධාරියාගේ වැටුපෙන් සියයට 5 ක් අයකර ගතයුතු වුවත් නිලනිවාස වල පදිංචි නිලධාරීන් 03කගේ කලත්‍රයන් රාජ්‍ය සේවයේ නියුතු වී සිටියද ඔවුන්ගේ වැටුපෙන් සියයට 5 ක් අයකර ගෙන නොතිබුණි. |
| (iii) XIX පරිච්ඡේදයේ 6.12 වගන්තිය | පදිංචි වී සිටීමේ කාලය ඉතා විශේෂ අවස්ථාවලදී දීර්ඝ කිරීමට නිවාස වෙන් කර දෙන බලධරයාට හැකි වුවද, එසේ දීර්ඝ කර ගැනීමකින් තොරව නිලධාරීන් නිල නිවාසවල රැඳී සිට තිබුණි. |

(iv) XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය

බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාල පරිච්ඡේදය වෙනුවෙන් නිලධාරියාගේ වැටුපෙන් සියයට 8 ක් සහ ප්‍රධාන තක්සේරුකරු විසින් ඒ නිවාසය සඳහා තක්සේරු කරනු ලබන එවකට පවත්නා විවෘත වෙළඳපොල කුලියද එකතු කිරීමෙන් ලැබෙන මුදල වූ දණ්ඩන කුලිය නිවාසලාභී නිලධාරියාගෙන් අයකරගතයුතු වුවත් නිලධාරීන් 8 දෙනෙකුගෙන් එලෙස දණ්ඩන කුලී අයකර ගෙන නොතිබුණි.

## 3.5 කාර්යසාධනය

ඉසිපතන නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් සඳහා 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් රු. 270,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් 2015 වර්ෂයේදී ගෙන නොතිබුණි.

## 3.6 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ආරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා ජාතික වශයෙන් තරගකාරී ලංසු කැඳවීමක් සිදුකළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 වර්ෂයට ආරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා තරගකාරී ලංසු කැඳවීමක් සිදුකර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත්, එසේ පිළියෙල ක ර තිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයේ ආරක්ෂක සේවාව වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සමාගමට මාසිකව රු.909,883 ක් ගෙවා තිබුණි. 2015 වර්ෂයේදී එම සේවාව රාජ්‍ය බැංකුවක් විසින් ඉටු කර තිබුණි. ඒ අනුව ගෙවන ලද මාසික සාමාන්‍ය වියදම රු.2,396,906 ක් විය. ආරක්ෂක සේවාව සැපයීමේ ආයතනය වෙනස් කිරීම නිසා 2015 වර්ෂයේදී මාසිකව රු.1,487,023 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 23 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 32 | 11 | 21 | - |
| (iii) | ද්විතියික මට්ටම | 85 | 81 | 04 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 108 | 118 | - | 10 |
| (v) | වෙනත් ( අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 01 | 04 | - |
| | **එකතුව** | **265** | **234** | **41** | **10** |

## 3.9 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 21 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 3.9.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 3.9.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-

1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**3.9.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 3.10.4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**3.10 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**3.10.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 3.10.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**3.10.2 මූල්‍ය කාර්යසාධනය**

**-----------------------**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය කාර්යසාධනය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| 2015 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව | | 2015 | 2014 |
|---|---|---|---|
| රු.මිලියන | | රු.මිලියන | රු.මිලියන |
| | **ආදායම** | | |
| 252,600.0 | ආදායම් බදු | 262,583.4 | 198,114.6 |
| 790,740.0 | දේශීය භාණ්ඩ හා සේවා බදු | 756,109.0 | 556,002.7 |
| 249,360.0 | ජාත්‍යන්තර වෙළදාම මත බදු | 263,428.2 | 233,808.0 |
| **1,292,700.0** | බදු ආදායම | **1,282,120.6** | **987,925.3** |
| **147,950.0** | බදු නොවන ආදායම හා වෙනත් | **112,124.8** | **139,706.1** |
| **1,440,650.0** | ආදායම්වල එකතුව (අ) | **1,394,245.4** | **1,127,631.4** |
| | **අඩුකළා : වියදම්** | | |
| 432,436.8 | වැටුප්, වේතන හා වෙනත් සේවා ප්‍රතිලාභ | 429,742.3 | 333,860.1 |
| 177,254.4 | වෙනත් භාණ්ඩ හා සේවා | 162,965.7 | 176,808.2 |
| 630,565.6 | සහනාධාර, ප්‍රදානයන් හා මාරු කිරීම් | 552,848.7 | 412,601.4 |
| 529,572.9 | පොළී ගෙවීම | 527,227.6 | 446,393.0 |
| 6,403.7 | වෙනත් පුනරාවර්තන වියදම් | 137.2 | 383.2 |
| **1,776,233.4** | මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (ආ) | **1,672,921.5-** | **1,370,045.9 --** |
| **335,583.4** | ආදායම් හිඟය (අ) - (ආ) | **278,676.1** | **242,414.5** |
| 835,396.8 | රාජ්‍ය ආයෝජන | 683,963.4 | 595,710.7 |
| **1,170,980.2** | අයවැය හිඟය | **962,639.5** | **838,125.2** |

| | | | |
|---|---|---|---|
| | **අයවැය හිඟය මූල්‍යනය** | | |
| 321,637.3 | විදේශ ණය ගැනීම් | 556,370.3 | 422,543.0 |
| (204,085.1) | විදේශ ණය ආපසු ගෙවීම | (187,112.8) | (106,979.2) |
| **117,552.2** | ශුද්ධ විදේශ ණය ගැනීම් | **369,257.5** | **315,563.8** |
| 17,950.5 | විදේශ ප්‍රදානයන් | 6,013.9 | 9,415.0 |
| **135,502.7** | විදේශ මූල්‍ය දායකත්වයේ එකතුව | **375,271.4** | **324,978.8** |
| 1,701,642.4 | දේශීය ණය ගැනීම් | 1,187,230.9 | 965,449.4 |
| (659,696.0) | දේශීය ණය ආපසු ගෙවීම් | (659,282.3) | (528,987.3) |
| **1,041,946.4** | ශුද්ධ දේශීය ණය ගැනීම් | **527,948.6** | **436,462.1** |
| 14,000.0 | ණය අයකර ගැනීම | 12,960.8 | 14,892.4 |
| 350.0 | ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් | 97.9 | 17,604.3 |
| - | තැන්පතු ගිණුම්වල හා බැරකම්වල ශුද්ධ වෙනස්වීම | 13,053.6 | 16,916.6 |
| - | මුදල් හා ආසන්න මුදල්වල වැඩිවීම/(අඩුවීම) | 33,307.2 | 27,271.0 |
| **1,191,799.1** | **මුළු මූල්‍යකරණයේ එකතුව** | **962,639.5** | **838,125.2** |

### 3.10.3 මූල්‍ය තත්ත්වය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අවසානයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්කම් හා බැරකම් පිළිබඳ සැසඳීමක් පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | **2015** | **2014** |
| | රු.මිලියන | රු.මිලියන |
| **මූල්‍ය නොවන වත්කම්** | **21,287.3** | **-** |
| **මූල්‍ය වත්කම්** | | |
| රජයේ නිලධාරීන්ට ණය | 22,326.7 | 23,396.3 |

| | | |
|---|---|---|
| රජයේ දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් | 9,878.0 | 9,679.0 |
| සාමාජික ගාස්තු | 3,517.2 | 3,517.2 |
| ණය දීම් | 174,196.1 | 207,966.1 |
| රජය සතු ව්‍යාපාරවල රජයේ දායකත්වය | 492,129.9 | 397,837.3 |
| ණය ගැනීම් මත ආයෝජන | 7,684,953.7 | 6,577,431.5 |
| මුද්දර තොග ගිණුම | 1,315.2 | 1,244.4 |
| **මූල්‍ය වත්කම්වල එකතුව** | **8,388,316.8** | **7,221,071.8** |
| **මුළු වත්කම්** | **8,409,604.1** | **7,221,071.8** |

**ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල්**

| | | |
|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | (403,025.5) | (356,664.8) |
| අවිනිශ්චිත අවස්ථා අරමුදල | 100.0 | 140.0 |
| විදේශ ණය චක්‍රීය අරමුදල | 25,747.6 | 25,835.3 |
| රජය සතු ව්‍යාපාරවල රජයේ දායකත්වය පදනම් වූ ආයෝජන | 666,326.0 | 605,803.4 |
| විවිධ අරමුදල් | 1,397.0 | 1,284.8 |
| ජංගම නොවන වත්කම් සංචිත අරමුදල | 21,287.3 | - |
| **මුළු අරමුදල්** | **311,832.4** | **276,398.7** |

**බැරකම්**

| | | |
|---|---|---|
| බැංකු අයිරාව | 197,655.0 | 164,347.8 |
| මහ බැංකු අත්තිකාරම් | 151,131.7 | 143,898.0 |
| රජයේ ණය ගැනීම් | 7,684,953.7 | 6,577,431.5 |
| තැන්පතු හා අනෙකුත් බැරකම් | 63,142.4 | 62,723.5 |
| රජයේ දෙපාර්තමේන්තු සමඟ වන මෙහෙයුම් ගිණුම | 277.0 | (4,315.0) |
| විවිධ ගිණුම් | 611.9 | 587.3 |
| **මුළු බැරකම්** | **8,097,771.7** | **6,944,673.1** |

| | | |
|---|---|---|
| **මුළු බැරකම් හා අරමුදල්** | **8,409,604.1** | **7,221,071.8** |
| | **=======** | **=======** |
| **අසම්භාව්‍යයන් සහ බැදීම්** | **431,954.3** | **519,273.9** |

**3.10.4 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 අංක 41 දරන විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තිය ප්‍රකාරව 2015 වර්ෂයේදී ආණ්ඩුව සඳහා ආණ්ඩුව වෙනුවෙන් අදාළ නීති ප්‍රකාරව රු.මිලියන 1,780,000 ක් නොඉක්මවන පරිදි ණය ලබා ගැනීමට හැකි වුවත්, ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී දේශීය හා විදේශීය ණය වශයෙන් රු.මිලියන 3,349,805 ක් ලබා ගෙන තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ණය සීමාව රු.මිලියන 1,569,805 කින් ඉක්මවා තිබුණි. මීට අනුරූපිව ඉකුත් වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු ණය සීමාව ඉක්මවීම රු.මිලියන 1,164,775 ක් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රජය විසින් ගෙවිය යුතුව තිබුණු ණය ශේෂය රු.මිලියන 7,684,954 ක් වී තිබුණද, නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල බලපෑම හේතුවෙන් එම ණය ශේෂය රු.මිලියන 1,025,180 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(i) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත අගය (Face Value) රු.මිලියන 3,695,541 ක් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට සනාථ කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු.මිලියන 508,763 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත අගය (Face Value) රු.මිලියන 663,285 ක් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට සනාථ කර තිබුණද, එම ශේෂය රු.මිලියන 30,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) විදේශීය ණය දෙන ආයතන සමඟ ජනරජය එළඹි ණය ගිවිසුම් 07 කට අදාළව 2015 දෙසැම්බර් 31 දින වන විට ජනරජය විසින් ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 338,141 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(iv) ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කල්බදු බැරකම රු.මිලියන 19,376 ක් ලෙස සනාථ කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල 2014 වර්ෂයේ සිට මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණු යතුරු පැදි වෙනුවෙන් වූ බැරකම රු.මිලියන 13,807 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(v) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ සිට දේශීය බැංකු 4 ක් මගින් ලබා ගෙන තිබුණු රු.මිලියන 7,550 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(vi) අමාත්‍යාංශයක් විසින් රජයේ ඇපකර සහිතව දේශීය බැංකුවලින් 2014 වර්ෂයේදී ලබාගත් ණය වෙනුවෙන් වාරික හා පොලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 2,469 ක් හා රු.මිලියන 9,562 ක් වශයෙන් එකතුව රු.මිලියන 12,031 ක් ගෙවා තිබුණි. එම ණය හා පොලී ගෙවීම රජය විසින් සිදු කර තිබුණද, රු.මිලියන 126,919 ක් වූ ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පොලී වශයෙන් රු.මිලියන 527,227 ක් ගෙවා තිබුණද, ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් විගණන නිරීක්ෂණවල ශුද්ධ ප්‍රතිඵලය හේතුවෙන් රු.මිලියන 16,818 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(i) භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් ඉපැයූ රු.මිලියන 13,998 ක පොලී ආදායම, පොලී ගෙවීම් ගිණුමට අධිභාර කිරීම හේතුවෙන් 2015 වර්ෂයේ ලද පොලී ආදායම් හා පොලී ගෙවීම් එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ii) මුහුණත වටිනාකමට වඩා අඩු මිලට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී බැඳුම්කරවල මුහුණත වටිනාකම බැඳුම්කර ගිණුමට බැර නොකර, බැඳුම්කර විකිණීමේ වටිනාකම පමණක් බැඳුම්කර ගිණුමට බැර කර තිබුණු අතර මේ හේතුවෙන් එම බැඳුම්කරවල මුහුණත වටිනාකම සමාලෝචිත වර්ෂයේදී මුදල් ගෙවා නිදහස් කිරීමේදී රු.මිලියන 40,378 ක බැඳුම්කර වට්ටම, පොලී ගිණුමට හර කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පොලිය රු.මිලියන 40,378 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන 854-1 වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ විදේශ ණය සඳහා පොලිය රු.මිලියන 83,063 ක් වී තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සටහන් අංක 08 අනුව පොලී ගෙවීම රු. මිලියන 77,174 ක් වී තිබීම හේතුවෙන් රු.මිලියන 5,889 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv) අමාත්‍යාංශයක් විසින් රජයේ ඇපකර සහිත බැංකු මගින් ලබාගත් ණය සඳහා රු.මිලියන 9,562 ක පොලී ගෙවා තිබුණද, එය පොලී ගෙවීම් ලෙස ගිණුම්ගත නොකර රාජ්‍ය ආයෝජන යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් පොලී ගෙවීම රු.මිලියන 9,562 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව රජය විසින් විවිධ රාජ්‍ය ආයතන වෙත එකතුව රු.මිලියන 174,196 ක උප ණය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී

අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල ශුද්ධ බලපෑම හේතුවෙන් එහි වටිනාකම රු.මිලියන 2,682 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(i) 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 14 කින් ලැබිය යුතු උප ණය ශේෂය රු.මිලියන 8,390.8 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, අදාල ආයතන විසින් එම ණය ශේෂ රු.මිලියන 7,215.4 ක් ලෙස සනාථ කර තිබීම හේතුවෙන් එම ආයතන 14 හි උපණය ශේෂය රු. මිලියන 1,174.4 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට ආයතන 07 කට අදාල උප ණය වටිනාකම රු.මිලියන 5,726.0 ක් ලෙස දක්වා තිබුණද, එම ආයතන විසින් එවා තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව ණය ශේෂය රු. මිලියන 9,332.6 ක් විය. ඒ අනුව එම ආයතන 07 ට අදාල ණය ශේෂය රු. මිලියන 3,606.6 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) 2001 වර්ෂයේ සියයට 9 ක පොලී අනුපාතයක් මත රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත ලබාදී තිබුණු රු.මිලියන 250 ක උපණය හා ඒ මත 2001 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු පොලී මුදල වන රු.මිලියන 337 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ බැදුම්කර නිකුත් කිරීම මගින් ඉපැයූ අධිමිල (Premium) මූල්‍ය ප්‍රකාශනවල වෙනම සටහන් කිරීම වෙනුවට භාණ්ඩාගාර බැදුම්කර ගිණුමට බැර කිරීම හේතුවෙන් භාණ්ඩාගාර බැදුම්කර වටිනාකම රු.මිලියන 18,846 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ලැබීම් හා ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 556,370 ක් හා රු.මිලියන 187,113 ක් දක්වා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි අනාවරණය වූ පහත සඳහන් විගණන නිරීක්ෂණවල බලපෑම හේතුවෙන් විදේශ ණය ලැබීම් රු.මිලියන 34,003 ක් අඩුවෙන්ද, විදේශ ණය ගෙවීම් රු.මිලියන 4,605 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(i) විදේශීය ණය ගිවිසුම් 7 කට අදාලව 2015 වර්ෂයේදී ලැබී තිබුණු රු.මිලියන 10,696.7 ක විදේශ ණය ප්‍රමාණය හා 2015 වර්ෂයේදී ගෙවා තිබුණු රු.මිලියන 4,604.7 ක විදේශ ණය ප්‍රමාණය ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ii) ණය ගිවිසුම් 41 කට අදාලව සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු විදේශ ණය ලැබීම්වලින් රු. මිලියන 23,306.5 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ආපසු ගෙවීම් ලෙස රු.මිලියන 187,113 ක් දක්වා තිබුණු අතර එහි සටහන් අංක 30(i) (විදේශ ණය ශේෂ ප්‍රකාශනය) අනුව විදේශ ණය ආපසු ගෙවීම් රු.මිලියන 174,800 ක් වීම හේතුවෙන් රු.මිලියන 12,313 ක වෙනසක් විය.

(උ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රජය විසින් විවිධ රාජ්‍ය ව්‍යාවසායන්වල කර ඇති ආයෝජනවල වටිනාකම රු.මිලියන 492,192 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන

පරික්ෂාවේදී අනාවරණය වූ පහත සඳහන් නිරීක්ෂණවල ශුද්ධ බලපෑම හේතුවෙන් එම වටිනාකම රු.මිලියන 105,068 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(i) සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම වෙත පවරා දී තිබුණු රජය සතු ඉඩමේ ප්‍රාග්ධනිත වටිනාකම රු.මිලියන 7,000 ක් වී තිබුණද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ii) මහා භාණ්ඩාගාරය විසින් පෞද්ගලික සමාගමක 2011 වර්ෂයේ සිදුකර තිබුණු රු.මිලියන 100 ක ප්‍රාග්ධන දායකත්වය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනය අනුව රජය සතු ව්‍යාපාර 129 කින් ව්‍යාපාර 6 කට අදාළව එකතුව රු.මිලියන 305,152 ක් මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය වශයෙන් දක්වා තිබුණද, අදාළ ආයතන විසින් ප්‍රාග්ධන දායකත්වය ලෙස එකතුව රු.මිලියන 339,069 ක් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් එම ව්‍යාපාර 06 ට අදාලව එකතුව රු.මිලියන 33,917 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iv) මූල්‍ය ප්‍රකාශන අනුව රජය සතු ව්‍යාපාර 129 කින් ආයතන 02 කට අදාළව එකතුව රු.මිලියන 349 ක් මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකත්වය ලෙස දක්වා තිබුණද, මහා භාණ්ඩාගාරය විසින් අදාළ ආයතනයන්හි ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කර නොමැති බවට ශේෂ සනාථ මඟින් තහවුරු කර තිබුණි. ඒ අනුව රු. මිලියන 349 ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(v) 2015 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රු. මිලියන 50,500 ක් හා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ රු. මිලියන 13,900 ක් ප්‍රාග්ධනයට දායක වී තිබුණද, එම වටිනාකම 2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඖ) ප්‍රධාන ආදායම් උපයන රාජ්‍ය ආයතන තුනකට අදාළව සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම්වල එකතුව රු.මිලියන 55,408 ක් වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

(ළු) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මුදල් අමාත්‍යාංශයේ ඇපවීම මත නෙළුම් කුළුණ බහු සම්ප්‍රේක්ෂණ හා විදුලි සංදේශ කුළුණ ඉදි කිරීම සඳහා 2012 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 104.3 ක් හෙවත් රු.මිලියන 15,238 ක වාණිජ ණයක් විදේශීය ණය දෙන ආයතනයකින් ලබාගෙන තිබුණද, එම අසම්භාව්‍ය බැරකම ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ළූ) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගිංනිල්වලා ගඟ හැරවීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 3,012 ක් හා රු.මිලියන 999 ක් වශයෙන් එකතුව රු.මිලියන 4,011 ක් අත්තිකාරම් ලෙස විදේශීය සමාගමකට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී 198-2-3-18-2502 වැය විෂය යටතේ රු.මිලියන 40 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම සීමාව රු.මිලියන 2,972 කින් ඉක්මවා රු.මිලියන 3,012 ක් වැය කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල අංක 8533 දරන අවිනිශ්චිත ගිණුමේ රු.මිලියන 400 ක ශේෂයක් පැවැති අතර, එම ශේෂයෙහි පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවට වාහන ලබා ගැනීම වෙනුවෙන් වැය කළ මුදලද ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වියදම සඳහා ප්‍රතිපාදන ලබා ගෙන ගිණුම්ගත කර ශේෂය නිරවුල් කර නොතිබුණි. ඊට අමතරව අංක 8233 දරන අවිනිශ්චිත ගිණුමේ රු.මිලියන 1,269 ක බැර ශේෂයක් පැවැති අතර, එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයවැය හිඟය රු.මිලියන 1,170,980 ක් වී තිබුණු අතර එය ඇස්තමේන්තුගත දළ දේශිය නිෂ්පාදනයෙන් සියයට 10.47 ක් වී තිබුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව ඇස්තමේන්තුගත අයවැය හිඟය දළ දේශිය නිෂ්පාදනයෙන් සියයට 5 කට අඩු විය යුතු වුවත්, එම සීමාව ඉක්මවා අයවැය ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

## 3.10.5 බැංකු අයිරාව

---------------

සමාලෝචිත වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු අයිරා ශේෂය රු.මිලියන 197,655 ක් ලෙස දක්වා තිබුණද, එහි සංයුතිය පහත පරිදි වේ.

(අ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 11 ක් අතරින් බැංකු ගිණුම් 02 කට අදාළව රු.මිලියන 204,760 ක බැංකු අයිරා ශේෂයක් පැවතුණු අතර එම ශේෂයෙන් වාසිදායක බැංකු ශේෂය වූ රු.මිලියන 11,224 ක් අඩු කිරීමෙන් පසු ලැබෙන අයිරා ශේෂය රු.මිලියන 193,536 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම ශේෂයට අග්‍රිම ගිණුම් ශේෂය ඇතුළු තැන්පත් ගිණුම්වලින් ජනිත වූ ගිණුම් 8 කට අදාල එකතුව රු. මිලියන 25,440 ක හර ශේෂයක් හා ගිණුම් එකකට අදාළ රු.මිලියන 29,560 ක බැර ශේෂයක් ගැලපීම් කර ඇති බව ගිණුම් සටහන් අංක 28 අනුව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ නිවැරදි බැංකු අයිරා ශේෂයේ එකතුව රු.මිලියන 204,760 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පැවැති නිවැරදි බැංකු අයිරා ශේෂයේ එකතුව රු.මිලියන 189,461 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා බැංකු අයිරා ශේෂය සියයට 8.08 කින් හෙවත් රු.මිලියන 15,299 කින් වැඩි වී තිබුණි.

(ඇ) වාර්ෂිකව ලබා ගත් බැංකු අයිරා වෙනුවෙන් ගෙවීමට සිදු වී තිබූ අයිරා පොලිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 11,086 ක් වී තිබුණි.

## 3.10.6 පොදු තැන්පත් ගිණුම

------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ ශුද්ධ බැර ශේෂය රු.මිලියන 62,756 ක් වූ අතර එය රු.මිලියන 62,901 ක බැර ශේෂයට රු.මිලියන 145 ක හර ශේෂය ගැලපීමෙන් පසු දක්වා ඇත.

### 3.10.7 පාඩු හා හානි

2015 වර්ෂයේ පාඩු හා හානි වශයෙන් කපාහැරීම් ලෙස රු. මිලියන 138 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ පාඩු හා හානි වශයෙන් කපා හැරීම්වල එකතුව වූ රු.මිලියන 383 ට වඩා රු.මිලියන 245 කින් අඩු වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියැදි විගණන පරීක්ෂාවට ලක් කළ වැය ශීර්ෂ 14 ක ට අදාළව විසර්ජන ගිණුම් අනුව මුදල් රෙගුලාසි 106 හා මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව වූ එකතුව රු.මිලියන 62 ක් වූ පාඩු හා හානි ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කර තිබුණු විසර්ජන ගිණුම්වල මුදල් රෙගුලාසි 109 යටතේ කපාහැර තිබුණු පාඩු හා හානි වටිනාකම රු.මිලියන 18 ක් වී තිබුණත්, එම පාඩු හා හානි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 3.10.8 ස්ථාවර වත්කම් ගිණුම් තැබීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වශයෙන් රු.මිලියන 21,287 ක් ඇතුළත් කර තිබුණි. එම වත්කම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල කිහිපයකට අයත් ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, ඉඩම්, කෙරීගෙන යන ගොඩනැගිලි හා කල් බදු වාහන සඳහන් කර තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන 1 හි සඳහන් කර තිබුණු ඉහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සඳහන් කර තිබුණු වත්කම් හැර අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාළ ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

### 3.10.9 රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය

සමාලෝචිත වර්ෂයේදී ආයතන 7 කට රජය විසින් රු.මිලියන 94,333 ක් ද ඇතුළුව 2015 දෙසැම්බර් 31 දින වන විට රජය සතු ව්‍යාපාර 129 ක් වෙනුවෙන් රු.මිලියන 492,130 ක මුළු ප්‍රාග්ධන ආයෝජනයක් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කර තිබුණු ආයෝජනය මුළු ආයෝජන වටිනාකමින් සියයට 19 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය හා රාජ්‍ය නොවන සමාගම් 45 ක කොටස්වල ආයෝජනය කර තිබූ රු. මිලියන 22,289 ක වටිනා කොටස් සහතිකවලට අදාල තොරතුරු 2015 දෙසැම්බර් 08 දිනැති අංක TOD/CM/3/1/8වෙළුම(iii)(ආ) දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් බලය ලබා දී තිබුණු සමීක්ෂණ මණ්ඩලය ඉදිරිපත් කරන ලද වාර්තාවට ඇතුළත් වී නොතිබුණි. ඒ අනුව සියළුම කොටස් ආයෝජනවල නිරවද්‍යතාවය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම කොටස්වල ආයෝජන වටිනාකම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සමාගම් 20 කට අදාලව එකතුව රු. මිලියන 115,635 ක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධනයට දායක වී තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණද, සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම සමාගම්වල ආයෝජිත වටිනාකම රු. මිලියන 44,641 ක් වී තිබුණි. එම

සමාගම් 20 ට අදාලව එකතුව රු. මිලියන 70,994 ක් මුල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව රු. මිලියන 1,508.7 ක් සමාගම් 3 ක කොටස් ප්‍රාග්ධනයට දායක වී තිබුණත්, 2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රාග්ධන දායකවීම ඇතුළත් කර නොතිබුණි.

**3.10.10 විදේශ ණය හා විදේශ ප්‍රදාන**

-----------------------------

සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව විදේශ ණය සහ විදේශ ප්‍රදාන ලෙස පිළිවෙලින් රු.මිලියන 250,687 ක් හා රු. මිලියන 18,334 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විදේශ ණය සඳහා වූ මුල් ඇස්තමේන්තුව රු.මිලියන 321,637 ක් දක්වා රු. මිලියන 70,951 කින් වැඩිකර, විදේශ ප්‍රදාන සඳහා වූ මුල් ඇස්තමේන්තුව රු.මිලියන 17,951 ක් දක්වා රු.මිලියන 16,117 කින් අඩු කර සංශෝධනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී විදේශ ණය ගෙවීම් ගිණුම්ගත කිරීමේදී ණය ගිවිසුම් 4 කට අදාළව රු. මිලියන 9 ක් අඩුවෙන් හා ණය ගිවිසුම් 4 කට අදාලව රු. මිලියන 18 ක් වැඩියෙන් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට ණය මුදල් ලැබී නොතිබුණු ණය ගිවිසුම් 5 කට අදාළව පොලී ලෙස රු. මිලියන 122 ක් හා වෙනත් ගෙවීම් (Other Payment) ලෙස රු. මිලියන 647 ක් 2015 වර්ෂයේදී වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදි රු.මිලියන 316,909 ක ප්‍රතිපාදන විදේශ ණයවලින් මුල්‍යකරණය කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි එම මුල්‍යකරණය යටතේ රු.මිලියන 252,591 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 64,318 ක් උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම 2015 වර්ෂයේ විදේශ ණය වශයෙන් රු.මිලියන 556,370 ක් ලැබී තිබුණත්, එම මුළු ණය මුදලම උපයෝජනය කළ හැකි වන පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විදේශ ප්‍රදානයන් මගින් මූල්‍යනය කිරීමේ අපේක්ෂාවෙන් මූලධන වියදම් සඳහා රු.මිලියන 17,905 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ඉන් රු.මිලියන 5,541 ක් උපයෝජනය කිරිම නිසා රු.මිලියන 2,364 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 31 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

(ඉ) ශීර්ෂ 17 ක් යටතේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ව්‍යාපෘතිවලට රු.මිලියන 9,337 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම නිසා සළසා තිබුණු ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දින වන විට විවිධ ආයතන හා රටවල් වෙතින් ලැබී තිබුණු රු.මිලියන 112 ක විදේශ ප්‍රදාන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.10.11 අත්තිකාරම් ගිණුම්**

2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත මඟින් විෂය අංක 32302 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් කාර්යය සඳහා උපරිම හර ශේෂයේ සීමාව රු.මිලියන 12.00 ක් ලෙස නියම කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවාසන වන විට එම සීමාව රු.මිලියන 4.18 කින් ඉක්මවා රු.මිලියන 16.18 ක් වී තිබුණි.

**3.10.12 දේශීය ආයතන වෙත ලබා දී ඇති උප ණය**

2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් රජයේ ආයතනවලට ලබා දී තිබුණු උප ණය ශේෂ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් රාජ්‍ය ආයතන 18 කට ලබා දී තිබුණු එකතුව රු.මිලියන 28,701 ක උප ණය ශේෂ එම ආයතන විසින් සනාථ කර නොතිබුණි.

(ආ) ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 20 හි 2015 දෙසැම්බර් 31 දිනට රජය විසින් රාජ්‍ය ආයතනවලට ලබා දී තිබුණු මුළු උපණය ශේෂය රු.මිලියන 23,673 ක් ලෙස දක්වා තිබුණි. එම මූල්‍ය ප්‍රකාශනවල සටහන 10 හි මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම යටතේ උපණය වටිනාකම රු.මිලියන 14,592 ක් ලෙස දක්වා තිබුණි. එම ශේෂ දෙක අතර වෙනස පිළිබඳ සැසදීමක් සිදු කර නොතිබුණි.

(ඇ) රජය විසින් ආයතන 04 ක් සඳහා ලබාදී තිබුණු රු. මිලියන 947 ක උප ණය 2015 දෙසැම්බර් 31 දින වන විට ගෙවා අවසන් කළ යුතුව තිබුණද 2016 මැයි 30 දින වන විටත් එම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2014 සැප්තැම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මාස දෙකක් ඇතුළත රියල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම ඈවර කිරීමට තීරණය කර තිබුණි. අදාළ සමාගම වෙත රජය විසින් ලබා දී ඇති ණය මුදල්වල හිඟ වාරික සහ පොලිය වන රු. මිලියන 276 ක මුදල පියවා ගැනීමට 2016 මැයි 30 දිනය තෙක් කටයුතු කර නොතිබුණි.

**3.11 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.11.1 රාජ්‍ය ආදායම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආදායම් සංකේත 94 කට අදාලව අනුමත වාර්ෂික ඇස්තමේන්තුගත මුළු ආදායම රු. මිලියන 1,689,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව රජයේ මුළු ආදායම රු.මිලියන 1,440,650 ක් දක්වා රු. මිලියන 248,350 කින් සංශෝධනය කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 15 ක ප්‍රමාණයක් ගෙන තිබු අතර, සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු. මිලියන 1,394,245 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව අනුව රජයේ මුළු සංශෝධිත ආදායම රු. මිලියන 1,440,650 ක් වී තිබුණි. 2015 වර්ෂයේ සත්‍ය ආදායම රු.මිලියන 1,394,245 ක් වී තිබීම නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් ඉලක්කය වෙත රු. මිලියන 46,405 කින් ළඟාවීමට නොහැකි වී තිබුණි.

(ආ) වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු ආදායම් සංකේත 7 කට අදාලව රු. මිලියන 50 ක ආදායමක් සමාලෝචිත වර්ෂය තුළදී රැස්කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 13 ක තථ්‍ය ආදායම් රැස්කිරීම් රු.මිලියන 72,647 ක් වී තිබුණු අතර 2014 වර්ෂයේදී අදාල ආදායම් සංකේතවල තථ්‍ය ආදායම් එකතුව රු.මිලියන 128,436 ක් වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී අදාල ආදායම් රැස් කිරීම රු. මිලියන 55,789 කින් හෙවත් සියයට 43 කින් අඩු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වාර්ෂිකව උපයන ආදායම රාජ්‍ය ආදායමට බැර නොකර සත්ත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලක් වෙත බැරකර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට අරමුදල තුළ රඳවාගෙන තිබුණු මුළු ආදායම රු.මිලියන 1,849 ක් වී තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වියදම් සඳහා ප්‍රතිපාදන සළසා දෙන බැවින් උපයන ආදායම් රාජ්‍ය ආදායමට බැර කළ යුතුව තිබුණි.

### 3.11.2 රාජ්‍ය වියදම

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. 2015 වර්ෂය සඳහා රාජ්‍ය වියදමට අවශ්‍ය ප්‍රතිපාදන 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනතින් හා 2015 අංක 01 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2014 අංක 41 දරන විසර්ජන පනතින් සළසා තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ වියදම් සඳහා රු.මිලියන 3,475,410 ක ප්‍රතිපාදන සළසා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| මූල්‍ය | මූලධන ප්‍රතිපාදන | පුනරාවර්තන ප්‍රතිපාදන | එකතුව |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විසර්ජන පනත මඟින් ලබා දෙන ලද ප්‍රතිපාදන | 1,232,457 | 868,834 | 2,101,291 |
| පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී තිබුණු ඒකාබද්ධ අරමුදලට වැය බරක් කර තිබුණු විශේෂ නීති සේවා වියදම් සඳහා ප්‍රතිපාදන | 802,381 | 434,327 | 1,236,708 |
| විශේෂ නීති සේවා සඳහා අතිරේකව ලබා දෙන ප්‍රතිපාදන | 17,317 | 120,094 | 137,411 |
| **එකතුව** | **2,052,155** | **1,423,255** | **3,475,410** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව රජයේ වියදම් සඳහා රු.මිලියන 3,475,410 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 2,767,039 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වාර්ෂයේ වියදම ඉකුත් වර්ෂයට වඩා රු.මිලියන 708,371 කින් හෙවත් සියයට 26 කින් වැඩි තිබුණි. 2015 වර්ෂයේ සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,203,280 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන ඉතිරිය රු.මිලියන 272,130 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7.8 ක් වී තිබුණි.

(ආ) විසර්ජන පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 63,440 ක් සහ මූලධන වියදම් සඳහා රු.මිලියන 137,856 ක් ලෙස එකතුව රු. මිලියන 201,296 ක් ලබා දී තිබුණි.

(ඇ) පුනරාවර්තන වියදම් සඳහා වැය විෂයයන් 66 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 6,630 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනය නොකිරීම නිසා එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැය විෂයයන් 1,318 ක් යටතේ රු.මිලියන 368,275 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.මිලියන 292,692 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 75,583 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය වැය විෂයයන් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 26 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) මූලධන වැය විෂයයන් 372 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 32,910 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකිරීම නිසා වර්ෂය අවසාන වන විට එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. තවත් මූලධන වැය විෂයයන් 992 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 391,419 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 276,935 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.මිලියන 114,484 ක් වී තිබුණි. එම ඉතිරිය වැය විෂයයන් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 26 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.11.3 අයවැය හිඟය

-----------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සංශෝධිත අයවැය හිඟය රු.මිලියන 1,170,980 ක් වූ අතර ඉකුත් වර්ෂයේ සංශෝධිත අයවැය හිඟයට වඩා රු. මිලියන 394,110 ක් හෙවත් සියයට 51 කින් වැඩි වී තිබුණි. 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව තථ්‍ය අයවැය හිගය රු. මිලියන 962,639 ක් වූ අතර එය ඇස්තමේන්තු අයවැය හිඟයට වඩා රු.මිලියන 208,341 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ තථ්‍ය අයවැය හිගය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 8.6 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.11.4** **ජනරජයේ බැරකම්**

----------------------

ජනරජයේ බැරකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ජනරජයේ දළ බැරකම රු.මිලියන 8,124,917 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ ජනරජයේ දළ බැරකම වූ රු.මිලියන 6,971,794 සමඟ සැසඳීමේදී රු.මිලියන 1,153,123 ක හෙවත් ඉකුත් වර්ෂයට වඩා සියයට 16.5 ක ප්‍රමාණයකින් වැඩිවී තිබුණි. එයට ප්‍රධාන වශයෙන් රාජ්‍ය ණය ගැනීම් රු.මිලියන 1,107,522 කින් වැඩි වීම බලපා තිබුණි. විස්තර පහත දැක්වේ.

| **බැරකම්** | **දෙසැම්බර් 31 දිනට** | | **වෙනස (අඩු)/වැඩි** | **වෙනස ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **2015** | **2014** | | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| බැංකු අයිරාව | 197,655 | 164,348 | 33,307 | 20.0 |
| මහ බැංකු අත්තිකාරම් | 151,132 | 143,898 | 7,234 | 5.0 |
| විදේශ ණය චක්‍රීය අරමුදල | 25,748 | 25,835 | (87) | 0.3 |
| විවිධ අරමුදල් | 1,397 | 1,285 | 112 | 9.0 |
| රාජ්‍ය ණය | 7,684,954 | 6,577,432 | 1,107,522 | 17.0 |
| ගිණුම් තැන්පතු හා අනෙකුත් බැරකම් | 63,142 | 62,724 | 418 | 0.7 |
| රාජ්‍ය දෙපාර්තමේන්තු බැරකම් ගිණුම | 277 | (4,315) | 4,592 | 106.0 |
| විවිධ ගිණුම් | 612 | 587 | 25 | 4.0 |
| **එකතුව** | **8,124,917** | **6,971,794** | **1,153,123** | **16.5** |

(ආ) 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ප්‍රකාරව රජයේ මුළු බැරකම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80 ක ප්‍රමාණයක් නොඉක්මවිය යුතුව තිබුණි. 2015 වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශනය අනුව මුළු බැරකම රු.මිලියන 8,124,916.4 ක

වට්නාකම 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය වූ රු.මිලියන 11,183,200.0 ක් සමඟ සැසඳූ විට එය සියයට 72.6 ක ප්‍රමාණයක් නියෝජනය වී තිබුණි. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය හා රජය විසින් රාජ්‍ය ව්‍යවසායන්ට පවරා දෙන ලද ණය ඉහත බැරකම්වලට ඇතුළත් නොවීම නිසා මෙම බැරකම් සීමාව ඉක්මවීමක් සිදු වී නොතිබුණි.